පළාත් පාලන ඡන්දය ඉල්ලා පැරැල්ල සංවිධානයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක්

ජනවාරි 30දා විභාගයට ගැනීමට තීන්දු කරයි

ස්ටැන්ලි සමරසිංහ

පළාත් පාලන මැතිවරණ පැවැත්වීම ආරම්භ කරන ලෙස ඉල්ලා පැරැල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා ගොනු කළ මූලික අයිතිවාසිකම් පෙත්සම විභාගයට ගැනීමට ශ්‍රේෂ්ඨාධිකරණය රියේ තීරණය කළේය. ප්‍රියසාද් ඩෙප්, උපාලි අබේරත්න සහ නලීන් පෙරේරා යන විනිසුරු මඩුල්ල හමුවේ සලකා බලන ලද මෙම පෙත්සම විභාගයට ගැනීම ජනවාරි 30ට කල් දැමීය. පළාත් සභා සහ ප්‍රාදේශීය සභා ඇමැති ෆයිසර් මුස්තාපා, එම අමාත්‍යාංශයේ ලේකම්, මැතිවරණ කොමිසමේ සභාපති මහින්ද දේශප්‍රිය, එහි සාමාජිකයන් ඇතුළු 11 දෙනෙකු මෙම පෙත්සමෙන් වගඋත්තරකරුවන් කර තිබිණි.

පෙත්සමේ සඳහන් වන්නේ මැතිවරණ කොමිසම පළාත් පාලන ඡන්දය පැවැත්වීමට අසමත්ව ඇති බවයි. සියලුම වගඋත්තරකරුවන් ඇතුළු පෙත්සම්කරුවන්ගේ වගකීම වන්නේ පළාත් පාලන මැතිවරණය පැවැත්වීමට අවශ්‍ය කටයුතු පිළියෙල කිරීමයි. අධිකරණය විසින් නියම කරනු ලබන දිනක මැතිවරණය පවත්වන ලෙස වගඋත්තරකරුවන්ට නියම කරන ලෙස පෙත්සම්කරු අධිකරණයෙන් ඉල්ලා සිටියි. නීතිඥ ටී. නන්දසිරි, අස්ථික දේවේන්ද්‍ර නීතිඥවරු, නීතිඥ මංජුල බාලසූරිය මහතාගේ උපදෙස් මත පෙත්සම්කරු වෙනුවෙන් පෙනී සිටියහ. ජනාධිපති නීතිඥ රොමේෂ් ද සිල්වා මහතා ඇමැතිවරයා වෙනුවෙන් පෙනී සිටියේය. නීතිඥ පුලස්ති රූපසිංහ මහතා මැතිවරණ සීමානිර්ණ කොමිටිය වෙනුවෙන් පෙනී සිටියේය.